# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1925/40 - 2015 ජූලි මස 29 වැනි බදාදා - 2015.07.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### සබරගමුව පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සහ 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 184 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

සබරගමුව පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන සහ වතු සුභසාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය මහීපාල හේරත් වන මා විසින් 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 184(1අ) වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය නගර සභාවේ සභාපති පූජ්‍ය වේවැල්දූවේ ඥානප්‍රභ හිමි ඇඹිලිපිටිය නගර සභාවේ සභාපති වශයෙන් කටයුතු කිරීමේදී ඉහත කී 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 184(1) වගන්තිය යටතේ දක්වනු ලබන කරුණු සම්බන්ධව වරදක් සිදුකොට ඇත්දැයි පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා පත් කරන ලද විශ්‍රාමලත් අධිකරණ නිලධාරියාගේ පරීක්ෂණ වාර්තාව මා හට ලැබී ඇති බැවින් ද, එකී වාර්තාව ප්‍රකාරව පූජ්‍ය වේවැල්දූවේ ඥානප්‍රභ හිමියන්ට එරෙහිව ඉදිරිපත් වී ඇති චෝදනා, සාක්ෂි, සහ ලේඛණ ද මා විසින් නිසි ලෙස පරීක්ෂා කර අධ්‍යයනය කිරීමෙන් අනතුරුව එකී පූජ්‍ය වේවැල්දූවේ ඥානප්‍රභ හිමියන් විසින් නගර සභා ආඥාපනතේ 184(1) වගන්තියෙහි සඳහන් කර ඇති වරදවල් එකක් හෝ කිහිපයක් සිදු කර ඇති බවට තීරණය කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට මා සෑහීමකට පත්වූ බැවින් 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 184(1ආ)(ආ) වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඇඹිලිපිටිය නගර සභාවේ සභාපති වන පූජ්‍ය වේවැල්දූවේ ඥානප්‍රභ හිමි ඇඹිලිපිටිය නගර සභාවේ සභාපති ධූරයෙන් සහ සභික ධූරයෙන් පහ කරමි.

මහීපාල හේරත්,
ප්‍රධාන අමාත්‍ය, නීතිය හා සාමය, මුදල් හා සැලසුම්,
පළාත් පාලන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, වනිතා කටයුතු,
සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන සහ වතු සුභසාධන,
පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය,
සබරගමුව පළාත.

2015 ජූලි මස 28 වැනි දින,
රත්නපුර, නවනගරයෙහි පිහිටි,
සබරගමුව පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

1A - PG 2494 — 16 (2015/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*